අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 - 2024

---

1. විගණන මතය

1.1 අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2024 වර්ෂයට අදාළව අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 29 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 පෙබරවාරි 09 දිනැති අංක 15/2016 දරන චක්‍රලේඛයේ 107 (සංශෝධන 05) අනුව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වාර්ෂිකව ගිණුම් ඉදිරිපත් කළ යුතු වුවත්, මහඔය ගොවිජන සේවා කාරක සභාව විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ ප්‍රමිත සටහන තුළ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ බව නිශ්චිතව සටහන් කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරන බවට හෙළිදරව් කළ යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 21 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල අඩංගු විය යුතු සංරචකයක් වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට එම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කරන බව.	සියලුම සංරචක ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ගොවි බැංකුව හා ගොවිජන කාරක සභාව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 ක් විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරනු ලබන බව.	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහඔය ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු යන ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම වන රු.258,765 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරනු ලබන බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකසා ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ ආරම්භක සමුච්චිත අරමුදල් ශේෂය රු.6,245,240 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරනු ලබන බව.	මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ආරම්භක සමුච්චිත අරමුදලෙහි නිවැරදි වටිනාකම දැක්විය යුතුය.
(ඇ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ 2023 වර්ෂ අවසානයේ රු.10,449,127 ක යූරියා අවසන් ශේෂයක් පැවතුණ ද යූරියා වෙළෙඳ ගිණුමේ ආරම්භක ශේෂය ලෙස රු.14,625,000 ක් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ යූරියා ආරම්භක තොග ශේෂය රු.4,175,873 කින් වැඩියෙන් දක්වා තිබුණි.	යූරියා තොගයේ ගැනුම් මිල සඳහන් කර නොමැති අතර රු.14,625,000 ක් ලෙස සටහන් කර ඇත්තේ පෙහොර ගැනුම් බව.	පොහොර තොග ආරම්භක ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ ජංගම ගිණුමට අදාළව සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව මුදල් පොතේ ශේෂය රු.11,709,868 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ එය රු.1,109,868 ක මුදලක් ලෙස රු.10,600,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.	රු.11,709,868 ක් ලෙස සටහන් විය යුතු මුදල පරිගණක ගත කිරීමේ දී රු.10,600,000 ක් මග හැරී මුද්‍රණය වී ඇති බව.	ගිණුම් ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දී ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් ගොවි බැංකු වෙනුවෙන් මිලදීගන්නා ලද රු.456,339 ක් වටිනා ගොවිජන බැංකු ගිණුම්කරණ මෘදුකාංගය සහ ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.2,060,847 ක් වටිනා මූලධන වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	වත්කම් හා මූලධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඊ)	ගොවිජන සේවා කාරක සභා 05 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් දරන ලද වියදම් රු.21,287,950 කින් ප්‍රාග්ධනිත කළ යුතු අයිතම හඳුනාගෙන එම අයිතම වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(උ)	ගොවිජන සේවා කාරක සභා 03 ක යූරියා, MOP හා TSP එකතුව රු.4,706,171 ක් වූ විකුණුම් වටිනාකම වෙළඳ ගිණුම් තුළ අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ ගනුදෙනු නිවැරදිව දැක්විය යුතුය.
(ඌ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ අවසන් තොග වටිනාකම රු.6,797,169 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ එම වටිනාකම රු.5,556,081 ක් ලෙස රු.1,241,088 ක් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන නිරීක්ෂණය නිවැරදිය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ තොග වටිනාකම දැක්වීමේ දී MOP තත්‍ය තොග ශේෂය නිවැරදි විය යුතු බව.	අවසන් තොග වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(එ)	ගොවිජන සේවා කාරක සභා 02 ක යූරියා සහ MOP ආරම්භක තොග ශේෂ එකතුව රු.5,519,220 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	ආරම්භක තොග වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඒ)	ඉරක්කාමම් ගොවිජන සේවා කාරක සභාව විසින් රු.2,628,150 ක් වටිනා යූරියා තොගයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	තොග වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂය තුළ අක්කරපත්තු නැගෙනහිර ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලද යූරියා, TSP සහ MOP පොහොර කිලෝග්‍රෑම් 48,538 ක අවසාන ශේෂය රු.8,172,474 ක් වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ රු.10,379,556 ලෙස දැක්වීම හේතුවෙන් රු.2,207,082 ක නොසැසඳීමක් පැවතුණි.	2025 වර්ෂයේ නිවැරදි කරමි.	තොග වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මඩානගම ගොවිජන සේවා කාරක සභාවට අදාළව සමාලෝචිත වර්ෂයේ යූරියා හා MOP පොහොර ආරම්භක තොග ශේෂයන්හි වටිනාකම්වල ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව හා වෙළෙඳ ගිණුම අනුව පිළිවෙලින්	2025 වර්ෂයේ නිවැරදි කරන බව.	නොසැසඳීම්වලට අදාළ හේතූන් සොයාබලා කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ

	රු.1,448,883 ක හා රු.49,582 ක නොසැසඳීම් පැවතුණි.		යුතුය.
(ආ)	පදියතලාව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළව ගිණුම් අයිතම 03 ක ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව වටිනාකම් සහ වෙළඳ ගිණුම අනුව වටිනාකම් අතර රු.2,919,944 ක නොසැසඳීමක් පැවතුණි.	ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව.	- එම -
(ඇ)	දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාවේ ගිණුම් විෂයන් 07 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව වටිනාකම හා මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අතර රු.3,709,695 ක නොසැසඳීම් පැවතුණි.	ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව.	මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	ලාහුගල ගොවිජන සේවා කාරක සභාවේ ප්‍රමාණාත්මක තොග ගිණුමේ සහනාධාර පොහොර විකුණුම් වටිනාකම රු.12,018,697 ක් විය යුතු වුවද එය අදාළ ගිණුම තුළ රු.2,620,935 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.9,397,762 ක නොසැසඳීමක් පැවතුණි.	ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව.	නොසැසඳීම්වලට අදාළ හේතුන් සොයාබලා කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	ලාහුගල ගොවිජන සේවා කාරක සභාවේ සහනාධාර පොහොර විකුණුම් වටිනාකම ප්‍රමාණාත්මක තොග ගිණුම් තුළ රු.2,620,935 ක් ලෙසද වෙළඳ ගිණුම තුළ රු.13,569,237 ක් ලෙසද දක්වා තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ රු.20,607,941 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකම් අතර නොසැසඳීම් පැවතුණි.	ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව.	- එම -

1.3.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 26 කට අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.140,872,351 ක වත්කම් හා වගකීම් ශේෂ පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් විවිධ සාක්ෂි හා ශේෂ සනාථ කිරීම් නොමැති වීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	මධ්‍යස්ථානය සතුව සාක්ෂි හා තොරතුරු සොයා ගත නොහැකි එම ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් 2025 වර්ෂයේ දී එම ශේෂ ගිණුම් වාර්තාවේ නිවැරදි කිරීමට අපේක්ෂා කරන බව.	අදාළ වත්කම් හා වගකීම් ගිණුම් ශේෂ තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි හා තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ආ)	ලාහුගල ගොවිජන සේවා කාරක සභාවේ පොහොර වෙනුවෙන් රු.10,557,309 ක් ගෙවීම් කර තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.13,926,100 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.3,368,791 ක් වටිනාකමට අදාළ ගෙවීම් වවුචර්පත් විගණනයට ඉදිරිපත් නොවුණි.	ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව.	සියළු ගෙවීම් වලට අදාළ සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත			
(i)	53 (1) වගන්තිය	ගොවිජන සේවා කාරක සභා 08 ක සමාලෝචිත වර්ෂයට අදාළව කුඹුරු ඉඩම් නාම ලේඛන සංශෝධනය සඳහා අයදුම්පත් 516 ක් ලැබී තිබුණ ද සංශෝධන සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත්තේ අයදුම්පත් 204 ක් පමණි.	ඉදිරියේදී සංශෝධනය කිරීමට කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදුකළ යුතුය.
(ii)	55 (1) වගන්තිය	ලාහුගල ගොවිජන සේවා බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම්වල මැනීම් කටයුතු සිදුකර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආරවුල් සහිත ඉඩම් හැර අනෙකුත් ඉඩම්වල මැනීම් කටයුතු අවසන් කර ඇති බව.	ආරවුල් සහිත ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු නිම කර මැනීම් කටයුතු නිම කල යුතුය.
(iii)	56 (4) වගන්තිය	ලාහුගල ගොවිජන සේවා බල ප්‍රදේශයේ අක්කර බදු ගෙවීම පැහැර හරින්නන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරියේදී හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා කටයුතු කරන බව.	පනත ප්‍රකාරව හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			

(i)	මු.රෙ. 110	ගොවිජන සේවා කාරක සභා 06 කට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන යාමට එකඟ වන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 502 (2)	ගොවිජන සේවා කාරක සභා 10 කට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන බව.	වත්කම් පාලනයට සහ ආරක්ෂාවට අදාළව අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ඇ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛ හා ලිප			
(i)	2006 දෙසැම්බර් 01 දිනැති අංක 2006/08 දරන චක්‍රලේඛය	ලාහුගල ගොවිජන සේවා කාරක සභාව විසින් තොග සම්බන්ධ ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ගෙන නොතිබුණි.	කල් ඉකුත් වූ තොග අපහරණය කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලය විසින් ඉල්ලීම් සිදුකර ඇති බව.	තොග පරීක්ෂාව හා කල් ඉකුත් වූ තොග අපහරණය කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii)	2020 ජුනි 25 දිනැති හා අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 07 කට අදාළ නිලධාරීන් 14 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණි.	අදාළ නිලධාරීන් ඉදිරියේ දී ඇප තැබීමට කටයුතු කරන බව.	ඇප තැන්පත් තැබීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධන iii) දරන චක්‍රලේඛය	දෛනිකව අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවත් එයට පටහැනිව ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් 2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 72 කදී රු.243,528 සිට රු.10,707,889 දක්වා පරාසයක මුදල් අත රඳවාගෙන තිබුණි.	මධ්‍යස්ථානවල පවතින කාර්ය බහුලත්වය හේතුවෙන් සෑම දිනකම මුදල් බැංකු ගත කිරීම සඳහා යාමට නොහැකි වී ඇති බව.	රජයේ මුදල්වල නිසි ආරක්ෂාව සැලසෙන පරිදි කටයුතු කළ යුතුය.

(ඉ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 මැයි 16 දිනැති 7/7/කු.ඉ.ලේ.ප්‍රති/2023 දරන ලිපිය	2023 මැයි 31 දින වන විට Geo Goviya වැඩසටහන යටතේ ඉඩම් මිනුම් කිරීම අවසන් කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 18 ක ඉඩම් කැබලි 69,445 කින් 43,592 කට අදාළව ඉඩම්වල පිහිටීම අක්ෂාංශ හා දේශාංශ ක්‍රමාංකනය සහිතව මැනුම් කිරීම් සම්පූර්ණ කර නොතිබුණි.	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති නිසා Geo Goviya වැඩසටහන නියමිත දිනට අවසන් කර ගැනීමට නොහැකි වූ බව.	නියමිත දිනට වැඩසටහන අවසන් නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වැඩසටහන කඩිනම් කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දිය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

අම්පාර දිස්ත්‍රික්කයට අයත් ගොවිජන සේවා කාරක සභා 29 කට අදාළව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.29,057,824 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.69,317,161 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,259,337 ක පිරිහීමක් පැවතුණි. එසේම ගොවි බැංකු 29 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.3,968,086 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,601,916 ක් වීම හේතුවෙන් ගොවි බැංකු වල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.633,830 ක පිරිහීමක් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් 2008, 2010 හා 2012 කාල සීමාව තුළ වාරික ගෙවීමේ පදනම මත ගොවිජන සේවා කාරක සභා 09 ක් වෙත ලබා දී ඇති අත්ට්‍රැක්ටර් 67 ක් සඳහා 2024 දෙසැම්බර් 31 වන දින වන විට රු.9,981,134 ක මුදලක් තවදුරටත් නිරවුල් කළ යුතුව පැවතුණි.	ඉදිරියේ දී අය කර ගැනීමට හා ගෙවීම් පැහැර හරින අය හට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	හිඟ වාරික මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 27 කට අදාළව වර්ෂ 03 සිට වර්ෂ 24 ක කාලපරිච්ඡේදයක් තුළ විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව පවතින රු.145,931,110 ක වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දිස්ත්‍රික් කාර්යාලය - අම්පාර, හා ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇති බව.	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඈ)	ගොවිජන සේවා කාරක සභා 27 කට අදාළව වර්ෂ 05 සිට වර්ෂ 26 ක කාලපරිච්ඡේදයක් තුළ ඉදිරියට ගෙන එමින් පවතින රු.291,427,497 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඇතැම් ශේෂ සඳහා තොරතුරු නොමැති අතර සොයාගත හැකි ශේෂ ඉදිරියේ දී පියවීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ ගබඩාව තුළ භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින නොමිලයේ බෙදාදිම සඳහා ලබා දී තිබූ TSP පොහොර කිලෝග්‍රෑම් 348.33 ක්, යූරියා කිලෝග්‍රෑම් 700 ක්, ජෛව දියර පොහොර ලීටර් 772.5 ක් හා කාබනික බයෝටීන් ලීටර් 135 ක් තිබූ අතර ඒවා බෙදාදීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	නියමිත කාල සීමාව තුළ කෘෂි රසායනික ද්‍රව්‍ය ගොවීන් වෙත බෙදා දීමට කටයුතු කළ යුතුය.
(ඉ)	ලාහුගල කුඹුරු ඉඩමෙන් වැලි කියුබ් 600 ක් ඉවත් කර ගැනීම සඳහා පුද්ගලයෙකු වෙත ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ 2024 අගෝස්තු 08 දිනැති ලිපිය මඟින් අවසර ලබා දී ඇතත් වැලි කියුබ් 100 ක් වෙනුවෙන් රු.20,000 ක මුදලක් අයකර ගෙන තිබීම හේතුවෙන් ඉතිරි වැලි කියුබ් 500 වෙනුවෙන් අයවිය යුතු රු.100,000 ක ආදායමක් අහිමි වී තිබුණි. ඉවත් කරනු ලැබූ වැලි කියුබ් ප්‍රමාණය තහවුරු කර ගැනීම සඳහා කළමනාකරණය විසින් කිසිඳු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර වැලි ඉවත් කිරීම සඳහා අවසර ලබාදීමට ප්‍රථම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අවසර දීමේ ලිපියක් ලබාගත යුතු වුවද එවැනි ලිපියක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	ඉදිරි වර්ෂයේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	අය නොකළ ආදායම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමටත්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් අවසර නොගෙන බලය ඉක්මවා කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා කළ යුතුය.
(ඊ)	වී මිලදී ගැනීමේ වැඩ සටහන යටතේ වී මෝල් හිමියන්ට නිකුත් කළ වී වෙනුවෙන් 2013 වර්ෂයේ සිට උහන ගොවිජන සේවා කාරක සභාවට අය විය යුතු රු.1,408,825 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට නඩු කටයුත්තක් පැවැත්වෙන අතර එමඟින් එම මුදල් අයකර ගැනිමට කටයුතු කරන බව.	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	2003 වර්ෂයේ ගොවි බැංකු ණය ගැති ශේෂ ලැයිස්තුවේ දක්වා ඇති චක්‍රීය ණය රු.445,802 ක් හා අත ඉතිරි මුදල් ඌනය වූ රු.93,035 ක් නිරවුල් කිරීමට නාමල්තලාව ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඌ)	වසර 10 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින රු.634,308 ක් වටිනා ලැබිය යුතු චක්‍රීය ණය ශේෂය සහ රු.599,527 ක් වටිනා ගෙවිය යුතු චක්‍රීය අරමුදල් ශේෂය නිරවුල් කිරීමට	මෙම චක්‍රීය ණය ශේෂ ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත

	මහඔය ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි.		යුතුය.
(එ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ හිටපු ලිපිකරුවෙකුගෙන් 2011 වර්ෂයේ සිට අය විය යුතු රු.500,226 ක මුදලක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඒ)	2018 හා 2019 වර්ෂයන්හි දී සීමා සහිත ලංකා පොහොර සමාගම විසින් ගොවිජන සේවා කාරක සභා 05 ක් වෙත ලබා දී ඇති රු.7,801,412 ක් වටිනා සංස්ථා දියර පොහොර තොගය කල් ඉකුත්ව තිබූ අතර ඒවා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන කාරක සභා තුළ ගොඩගසා තිබුණි.	මෙම තොග ඉවත්කර ගන්නා ලෙස අදාළ පොහොර සමාගම් දැනුවත් කර ඇත. ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරන බව.	කල් ඉකුත් වූ පොහොර තොග බැහැර කිරීමට හා පාඩුවක් සිදු වී ඇත්නම් ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඔ)	තම්බිලුවිල් ගොවිජන සේවා කාරක සභාවට අයත් ගොවීන් 66 දෙනෙකු සතුව පවතින අක්කර 140 කට වාරි ජලය සපයන වැව් 02 ක් සමාලෝචිත වර්ෂයේ ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් හානි වී ඇති අතර ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය විසින් එම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අදාළ ගොවීන් හට වගා කටයුතු සිදුකර ආදායම් ඉපයීමට තිබූ අවස්ථාව අහිමි වී ගොස් තිබුණි.	ඉදිරි වර්ෂයේ සැලසුම් සඳහා මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කර ඇති බව.	හානි වූ වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ඕ)	ගොවිජන සේවා කාරක සභා 11 කට අදාළව ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ (ආ.සං.) 2006 ජුනි 14 දිනැති අංක 7/5/6/වි.වි./අ.බ දරන ලිපියේ අංක 4 ඡේදය අනුව වාර්ෂිකව අයකරන අක්කර බදු මුදල් වර්ෂයේ මාර්තු 31 වැනි දින වන විට අයකර අවසන් කර තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පසුගිය වර්ෂවලට අදාළව රු.5,625,610 ක අක්කර බදු වටිනාකමක් අයකර ගත යුතුව පැවතුණි.	ඉදිරි වර්ෂයේ දී අයකර ගැනීමට කටයුතු කරන බව.	පසුගිය වර්ෂවලට අදාළව අයකර ගත යුතුව පවතින අක්කර බදු වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ දී ගොවිජන සේවා කාරක සභා 03 ක් වෙත ලැබී තිබූ රු.10,000,000 ක වටිනාකමකින් යුතු ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර 10 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වර්ෂ 03 ක පමණ කාලයක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තබා තිබුණි.	ලෝක බැංකු ආධාර යටතේ ලැබුණු පැළ සිටුවීමේ යන්ත්‍ර යොදාගෙන ආදර්ශ වී වගාවක් සිදු කරන ලද අතර, යන්ත්‍ර වල පැළ	එම යන්ත්‍ර උපයෝජනයට ගැනීමට අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

		සිටුවීමේ පරතරය වැඩි නිසාවෙන් එමඟින් වගා කටයුතු සිදු කිරීම පාඩු බව හඳුනා ගන්නා ලදී. බැවින් එම යන්ත්‍ර යොදාගෙන වගා කිරීමට ප්‍රදේශයේ ගොවීන් මැලි කමක් දක්වන නිසා එම යන්ත්‍රවල ප්‍රයෝජනයක් නොමැති බව.	
(ආ)	දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 17 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 02 සිට වසර 07 කට අධික කාලයක සිට භාවිතා නොකර පවතින බව නිරීක්ෂණය වූ අතර එයින් භාවිතා කළ නොහැකි වාහන හා යන්ත්‍රෝපකරණ වෙන්දේසියේ විකිණීමට හා අලුත්වැඩියා කළ හැකි වාහන හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර භාවිතා කිරීමට කාරක සභාවේ අවධානය යොමුව නොතිබුණි.	මෙම යන්ත්‍රෝපකරණ වෙන්දේසි කිරීමට සුදුසු බවට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණද මේ වන තෙක් අවසර ලැබී නොමැති බව.	වත්කම් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ එසේ නොහැකි නම් වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 04 ක් වෙත දිස්ත්‍රික් කාර්යාලය විසින් 2004 වර්ෂය තුළ දී ලබා දී තිබුණු වතුර මෝටර් 30 ක් විගණිත දින වන විටත් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	වෙන්දේසි කිරීමට ඉල්ලුම් කර ඇති බව.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හා නිෂ්කාර්යව තබා ගැනීමට වගකිව යුතු පුද්ගලයින් සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	ගොවිජන සේවා කාරක සභා 02 ක් සහ ගොවිජන බැංකු 02 ක් විසින් 2023 හා 2024 වර්ෂයන්වලදී මිලදීගන්නා ලද එකතුව රු.444,405 ක් වටිනා මෘදුකාංග හා උපකරණ අයිතම 08 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	මෙම උපකරණ භාවිතය සඳහා අවශ්‍ය මෘදුකාංගය තවමත් මධ්‍යස්ථාන වෙත ලැබී නොමැති අතර එය ලැබුණු විගස භාවිතයට ගැනීමට බලාපොරොත්තු වන බව.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ)	මල්වත්ත ගොවිජන සේවා කාරක සභාව සතු රු.647,000 ක් වටිනා අත් ට්‍රැක්ටරයක් වසර 05 කට වැඩි කාලයක සිට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	අත් ට්‍රැක්ටරය වෙන්දේසි කිරීමට ඉල්ලුම් කර ඇති බව.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	ගොවිජන සේවා කාරක සභා 15 ක් කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර 15 ක් 2022 වර්ෂයේ සිට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	අදාළ ආයතනය වෙත භාරදීමට කටයුතු කරමින් පවතින බව.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් ගොවිජන බැංකුව වෙත 2010 සහ 2024 වර්ෂවල දී ලබා දී තිබූ රු.859,907 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	පිළිතුරු සපයා නොමැත.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඌ)	ගොවිජන සේවා කාරක සභාවල සහ ගොවි බැංකුවල කාර්යක්ෂමතාවය වැඩි කිරීමේ අරමුණින් ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් 2024 වර්ෂයේ දී මිලදීගෙන තිබූ රු.4,216,920 ක් වටිනා පරිගණක උපාංග කට්ටල 15 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	ඉදිරියේ දී භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	- එම -

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංවර්ධන නිලධාරී තනතුර සඳහා ගොවිජන සේවා කාරක සභා 14 ක නිලධාරීන් 34 දෙනෙකු හා දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකු වශයෙන් නිලධාරීන් 37 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර ගොවිජන සේවා කාරක සභා 13 ක සංවර්ධන නිලධාරීන් 30 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	අතිරික්ත ලෙස දක්වා ඇති නිලධාරීන් බොහොමයක් දෙනා දමිළ මාධ්‍යයේ නිලධාරීන් වන බැවින් පුරප්පාඩු පවතින සිංහල මාධ්‍ය ගොවිජන සේවා කාරක සභාවල රාජකාරී සඳහා අනුයුක්ත කිරීමේ හැකියාවක් නොමැති බව.	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට හා අතිරික්ත නිලධාරීන් වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මධ්‍යස්ථාන කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා ගොවිජන සේවා	මෙම පුරප්පාඩු ඉදිරියේ දී සම්පූර්ණ කර ගැනීමට	සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර

	කාරක සභා 19 ක නිලධාරීන් 22 දෙනෙකු හා දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකු වශයෙන් නිලධාරීන් 25 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර කාර්තිව් ගොවිජන සේවා කාරක සභාවේ මධ්‍යස්ථාන කළමනාකරණ සේවා නිලධාරීන් 02 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	කටයුතු කරන බව.	ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් යොදා ගත යුතුය.
(ඇ)	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුර සඳහා ගොවිජන සේවා කාරක සභා 21 ක නිලධාරීන් 89 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර ගොවිජන සේවා කාරක සභා 03 ක නිලධාරීන් 05 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	මෙම පුරප්පාඩු ඉදිරියේ දී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව.	- එම -

4. ගොවිජන බැංකු

	විගණන නිරීක්ෂණ	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2012 පෙබරවාරි 29 දිනැති අංක 2012/04 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 1.6 වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන මට්ටම දියුණු කිරීම උදෙසා සෑම ගොවිජන සේවා කාරක සභාවක්ම ගොවි බැංකු ක්‍රමවත්ව පවත්වා ගත යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 07 ක් විසින් 2009 වර්ෂයෙන් පසු ගොවි ජනතාවගෙන් තැන්පතු මුදල් එක්රැස් කළ ද ණය ලබාදීමක් සිදුකර නොතිබුණි.	ඉදිරියේ දී සක්‍රීය තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව ගොවීන් වෙත සහන සැලසීම සඳහා ණය ලබාදීමට ගොවි බැංකුව ක්‍රියාත්මක මට්ටමට ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 2012/04 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 2.6.2 (vii) ඡේදය අනුව වසමේ ගොවීන් වෙත නිකුත් කර ඇති ණය කලට වේලාවට අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් අවශ්‍ය කටයුතු නොකිරීම නිසා ගොවිජන සේවා කාරක සභා 18 කට අදාළව 1999 යල කන්නයේ සිට 2024 යල කන්නය දක්වා රු.17,774,675 ක කල් පසු වූ ණය හා පොලී මුදලක් අයකර ගෙන නොතිබුණි.	හිඟ ණය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	කල්පසු වූ ණය අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඈ)	මහඔය ගොවිජන බැංකුවේ වසර 10 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින රු.634,308 ක් වටිනා ලැබිය යුතු චක්‍රීය ණය ශේෂය සහ රු.599,527 ක් වටිනා ගෙවිය යුතු චක්‍රීය අරමුදල් ශේෂය නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.	ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි.	චක්‍රීය අරමුදල් ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.